ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

# ලංසු කැඳවීම

## මාර්ග සංවර්ධන අධිකාරියෙහි අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන අංශයේ කොළඹ කටුනායක අධිවේගී මාර්ගය සහ නව කැළණි පාලම් අධිවේගී මාර්ග කොටස සඳහා ගිනිඅවි සහිත ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

01. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන අංශය (අ.මා.මෙ.ග හා ක ඒකකය) සඳහා **ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී සිටින පිළිගත් සේවා සපයන** යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| කොන්ත්‍රාත් අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත් කාලය (දින) | ලංසු ආරක්ෂණය (රු.) |
|---|---|---|---|
| RDA/EOM&M/ARMED-SEC/CKE&NKB/2023/47 | මාර්ග සංවර්ධන අධිකාරියෙහි අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන අංශයේ කොළඹ කටුනායක අධිවේගී මාර්ගය සහ නව කැළණි පාලම් අධිවේගී මාර්ග කොටස සඳහා ගිනිඅවි සහිත ආරක්ෂක සේවාව සැපයීම. | 365 | 850,000.00 |

02. මාර්ග සංවර්ධන අධිකාරියේ අ.මා.මෙ.න. හා ක. ඒකකය ක්‍රියාත්මක නියෝජිත ආයතනය වේ.

03. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරුවන්, මේ හා සමාන ධාරිතාවයකින් යුත් ගිනි අවි සහිත ආරක්ෂක සේවාව සැපයුම පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය.

05. ලංසු අවසන් කරන දින සිට කැලැන්ඩර් දින 91 ක් **(2024.09.19)** දක්වා ලංසුව වලංගු විය යුතුය.

06. ලංසු, ඉහත වගුවෙහි දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතුය. (**2024.10.17**) දින දක්වා වලංගු විය යුතුය.) වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. ලංසුකරු විසින් ලංසු ලියකියවිලිවලට අයත් සෑම පිටුවකම අත්සන් යොදා කාර්යාලීය මුද්‍රාව තැබිය යුතුය.

08. පූර්ව ලංසු රැස්වීම **2024.06.10** දින ප.ව **13.30** ප්‍රසම්පාදන අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, 04 වන මහල, මගනැගුම මහමැදුර, නො. 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයෙහිදී පැවැත්වේ. ඊට සහභාගී වීම අනිවාර්ය වන අතර සහභාගී නොවන ලංසුකරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට සිංහල භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් ආපසු නොගෙවනු ලබන රු. **10,000.00 +** අදාළ වන බදු සමග ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව කහටගහහේන, වල්ගම, බණ්ඩාරගම දරන ස්ථානයේ පිහිටි මාර්ග සංවර්ධන අධිකාරියට අයත් අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමණාකරන ඒකකයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව **2024.05.28** දින සිට **2024.06.19** දින දක්වා පෙ.ව. 9.00 පැය සිට ප.ව. 2.30 පැය දක්වා කාලය තුළ ලබා ගත හැකිය. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව, ඒජන්ත/නියෝජිතවරයා සහ ටෙන්ඩරයේ සාර්ථක ජයග්‍රාහකයින් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙහි ටෙන්ඩරයට අදාළව ලියාපදිංචි වී සිටිය යුතුය. **2024.06.20** වන දින ප.ව. 2.00 ට ලංසු භාර ගැනීම අවසන් වේ.

10. ලංසුව හා පිටපතක් (මුද්‍රා තබන ලද) **2024.06.20** වන දින **ප.ව. 02.00** ට පෙර සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව, මාර්ග සංවර්ධන අධිකාරිය, 01 වන මහල, මගනැගුම මහමැදුර, නො. 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ලංසුපත් බහාලු ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරෙහි **"ගිනි අවි සහිත ආරක්ෂක සේවාව සැපයීම - කොළඹ කටුනායක අධිවේගී මාර්ගය සහ නව කැළණි පාලම් අධිවේගී මාර්ගය සඳහා"** යනුවෙන් සඳහන් කළ යුතුය.

11. මාර්ග සංවර්ධන අධිකාරිය, 04 වන මහල, මගනැගුම මහමැදුර, නො. 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත,බත්තරමුල්ල දරන ස්ථානයේ පිහිටි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ප්‍රසම්පාදන අංශ කාර්යාලයේ දී ලංසු භාරගැනිම අවසන් වූ වහාම එකී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී විය හැක.

12. වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක :

- ඉංජිනේරු (අ.මා.මෙ.න. හා ක අංශය), මාර්ග සංවර්ධන අධිකාරිය දු.ක. (038-2289201)

**සභාපති,**
**මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව,**
**මාර්ග සංවර්ධන අධිකාරිය,**
**01 වන මහල, මගනැගුම මහමැදුර, නො.216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,**
**කොස්වත්ත, බත්තරමුල්ල.**